# දුම්රිය ආඥා පනත

අධිකාරිය : 200

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සම්බන්ධ ආඥා පනතකි.

ආඥා පනත්

| | | |
|---|---|---|
| 1920 | අංක | 09 |
| 1903 | අංක | 01 |
| 1904 | අංක | 02 |
| 1914 | අංක | 04 |
| 1915 | අංක | 06 |
| 1922 | අංක | 16 |
| 1925 | අංක | 10 |
| 1932 | අංක | 01 |
| 1932 | අංක | 05 |
| 1937 | අංක | 17 |
| 1939 | අංක | 08 |
| 1941 | අංක | 33 |
| 1942 | අංක | 29 |
| 1943 | අංක | 23 |
| 1944 | අංක | 15 |
| 1950 | අංක | පනත් අංක 18 |

(1902 ක්වූ ඔක්තෝම්බර් මස 15 දින)

| | | |
|---|---|---|
| කෙටි හැඳින්වීම | 01. | මෙම ආඥාපනත දුම්රිය දෙපාර්තමේන්තු ආඥා පනත යනුවෙන් හැඳින්වේ. |
| දුම්රිය සාමාන්‍යාධිකාරී, | 02 | (l) පහත සඳහන් පත් කිරීම: |
| අනිකුත් නිලධාරීන් හා ලිපිකරුවන් පත් කිරීම | (අ) | නිලයෙන් හෝ නමින් යම් පුද්ගලයෙකු දුම්රිය සාමාන්‍යාධිකාරී ලෙසට හෝ වැඩ බැලීම සඳහා කිරීම. |
| (1939 අංක 08) | (ආ) | මෙම ආඥා පනතේ අවශ්‍යතාවයන් සඳහා පත් කරනු ලබන අනෙකුත් නිලධාරීන් හා ලිපිකරුවන් |

(1983 අංක 49 පනතින් 2 (අ) වගන්තිය ඇතුලත් කර ඇත.

(2) මෙහි (1) වන උප වගන්තියේ (අ) යටතේ සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් පත් කරනු ලබන ඕනෑම නිලධාරියෙකුට, මෙම ආඥා පනතින් තමා වෙත ලැබී ඇති බලතල දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් පැවරිය හැකි වන්නේය

**නියෝග (1950 අංක18)**

03 ඇමතිවරයා විසින්, දුම්රිය මගී ප්‍රවාහනය, මඟීන් සහ බඩු ප්‍රවාහනය, ගල් අඟුරු සහ විසල් ප්‍රවාහනය හා අනිකුත් සෑම ද්‍රව්‍යයක්ම ප්‍රවාහනයට අදාළව කලින් කලට නීති පනවනු ලබන අතර (නීති පනවා ඇති විටෙක එම නීති අවලංගු කිරීම, එකතු කිරීම හෝ වෙනස් කිරීම ඇතුළුව) එම ද්‍රව්‍ය වර්ගීකරණය කිරීම, ගාස්තු නියම කිරීම, විශේෂ ගාස්තු පැනවීම ආදී කරුණු මෙන්ම ආඥා පනතේ අඩංගු කරුණු හා වෙනත් කරුණු සම්බන්ධයෙන් යහපත්, ලාභ ලබන දුම්රිය සේවාවක් පවත්වාගෙන යාම සඳහා නවගුණ සම්පාදනය කරනු ලබයි. එසේ වුවද මෙහි උප ලේඛනයේ සඳහන් ගාස්තු ප්‍රමාණයන් ඉක්මවා ඇති විශේෂ අවස්ථාවලදී අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන ගාස්තු ප්‍රමාණයන් විශේෂිතව [illegible] බඩු ප්‍රවාහනය කිරීමේදී යොදා ගත හැකිය.
එමෙන්ම, ඉතා හදිසි කටයුත්තක් වශයෙන් [illegible] යන කල්හි දුම්රිය සාමාන්‍යාධිකාරීවරයාට මඟීන්, බඩු පාර්සල් සහ සතුන් ප්‍රවාහනයේදී පහත සඳහන් කොන්දේසිවලට යටත්ව ගාස්තු අඩු කළ හැක.

(අ) පනවා ඇති ගාස්තු ප්‍රමාණයෙන් 40% නොඉක්මවූ ප්‍රමාණයකින් හෝ
(ආ) ඇමතිවරයාගේ එකඟතාවයකින් ඇති වෙනත් ප්‍රමාණයකින්, මෙය හැරුණු විට අනිකුත් සෑම අවස්ථාවකදීම මඟීන් හා බඩු ප්‍රවාහනයේදී ගාස්තුවල වෙනස් කිරීමක් කරන්නේ නම් ඒ සඳහා මුදල් ඇමතිවරයාගේ එකඟත්වය ලබා ගත යුතුය.





**නීති, නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට හා සෙනෙට් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය**

04 (මෙය දැනට සංශෝධනය වී ඇත) සෑම නියෝගයක්ම (නීතියක්ම) පාර්ලිමේන්තුවේදී අනුමත වීමෙන් පසුව නීතිගත වන්නේය.

**ගාස්තු කලින් ගෙවිය යුතුය**

05 කලින් මුදල් ගෙවා ලබා ගත් ප්‍රවේශ පත්‍රයක් නොමැතිව කිසිම පුද්ගලයෙකුට දුම්රිය මැදිරියකට ඇතුල් වීම හෝ එහි ගමන් කිරීම තහනම්ය. දුම්රියෙන් ගමන් යන්නා සෑම මගියෙකුම තමා ගමන් කිරීමට බලාපොරොත්තු වන පංතියට අයත්, ගමනාන්තය දක්වා දුම්රිය ප්‍රවේශ පත්‍රයක් පළමුව මුදල් ගෙවා ලබා ගත යුතු අතර, ගමනාන්තයේදී දුම්රිය ප්‍රවේශ පත්‍ර එකතු කරන්නා වෙත භාර දිය යුතුය. ඉහත ආකාරයෙන් දුම්රිය ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන්නෙකු ගමන ආරම්භයේ සිට ගෙවිය යුතු ගාස්තුව ගෙවීමට යටත් වන්නේය. (අදාළ දඩ මුදල් සහිතව) (තමා ගමන ආරම්භ කළ ස්ථානය ඔප්පු කිරීමට [illegible])

**කොන්දේසි සහිතව ගමන් ගාස්තු භාර ගතයුතු බව**

06 [illegible] එසේ මුදල් ගෙවන [illegible] දුම්රියේ ගමන් කිරීමට [illegible] යන විශ්වාසය [illegible] එසේ මුදල් ගෙවූ සෑම මගියෙකුටම ගමන් කිරීමට පහසුකම් නැති අවස්ථාවලදී දුර ගමන් යන අයවලුන්ට ප්‍රමුඛත්වය දිය යුතු වන අතර, ගමන් කිරීමේ පංතියද සැලකිල්ලට ගනු ලැබේ. එසේ වුවද, ගමන් ගන්නා දුර ප්‍රමාණය හෝ පංතිය සැලකිල්ලට නොගෙන රැජිනගේ හමුදා නිලධාරීන්ට හා සොල්දාදුවන්ට ප්‍රමුඛත්වය ලැබෙන්නේය

සමහර වැරදි සඳහා පනවනු ලබන දඩ 07
(194 අංක 23)

මොනයම් පුද්ගලයෙකු විසින්:-

(අ) මුදල් ගෙවා ටිකට් පතක් ලබා නොගෙන හෝ අවලංගු ටිකට් පතක් උපයෝගී කර ගනිමින් හෝ ඉහළ පන්තියක ගමන් කරන විටකදී හෝ නියාමකයේ අවසරය නොලබා ටිකට් පතේ ගමනාන්තය ඉක්මවා ගමන් කරන විටදී හෝ

(1950 අංක 18) (ආ) ටිකට් පරීක්ෂකවරයෙකු විසින් ඉල්ලා සිටින අවස්ථාවකදී මුදල් ගෙවා ලබාගත් ටිකට් පතක් ඉදිරිපත් කිරීමෙන් වැළකී සිටීම/ ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම හෝ

(1950 අංක 18) (ඇ) ටිකට් එකතු කරන්නෙකු විසින් ටිකට් පත භාරදෙන ලෙසට ඉල්ලා සිටින අවස්ථාවක එසේ භාර නොදීම හෝ

(1950 අංක 18) (ඈ) දුම්රිය දෙපාර්තමේන්තුවේ ටිකට් විකිණීමට බලය ඇති නිලධාරියෙකු හැර අන් කිසිවෙකු ටිකට් විකිණීම, පැවරීම හෝ

(ඉ) ඉහත (ඈ) වශයෙන් ලබාගත් ටිකට් පතක් උපයෝගී කරගෙන ගමන් කිරීම හෝ

(1943 අංක 23) (ඊ) [illegible] ගමනාන්ත දුම්රිය ස්ථානයෙන් පිටවීම පැහැර හැරීම,

(1943 අංක 23) (උ) මොනයම් ආකාරයකින් හෝ ගමන් ගාස්තු ගෙවීම පැහැර හැරීම.

සම්බන්ධයෙන් වරදක් කළා සේ සලකනු ලබන අතර ඔහු අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු රු.50/-ක දඩයකට හෝ එක් මසක සිරදඬුවමකට හෝ එම දඬුවම් දෙකටම යටත් වන්නේය. එසේ වුවද ඉහත (අ) වශයෙන් කරන ලද වරදක් සම්බන්ධයෙන් වරදකරු විසින් දුම්රිය ස්ථානාධිපතිට හෝ බලයලත් වෙනත් නිලධාරියෙකුට, ගමන්ගාස්තුව මෙන් දෙගුණයක් දඩය සහිතව හෝ දෙගුණයක වැඩිපුර ගාස්තුව ගෙවන්නේ නම් ඔහුට විරුද්ධව අධිකරණමය පියවර ගැනීම අවශ්‍ය නොවේ.

(1983 අංක 49 දරණ පනතින් දඩ මුදල රු.300 දක්වා වැඩිකර ඇත.)

(2005 අංක 12 දරණ දඩමුදල් වැඩි කිරීමේ පනතට අනුව " රුපියල් 1000/- කට නොඅඩු සහ 1500/- ක් නොඉක්මවන දඩයකට, යනුවෙන් සංශෝධනය කර ඇත.)





ටිකට් පතක් ඉදිරිපත් කිරීමට අපොහොසත් මගියෙකුට ඒ වෙනුවෙන් ගෙවීම් කිරීම කිරීම 08

කලින් මුදල් ගෙවා ලබාගත් ටිකට් පතක් නොමැතිව ගමන් කිරීමේ හේතුව මත ගාස්තුව වන ගෙවීමට නොහැකි වන විටකදී හෝ ගමනාන්තය ඉක්මවා ගමන් කිරීම වෙනුවෙන් වැඩිපුර ගෙවීම් කිරීමට නොහැකි වන විට හෝ දිනය ඉකුත් වූ ටිකට් පතකින් ගමන් කර ඇති විට හෝ ඉහළ පන්තියක ගමන් කර ඇති විට හෝ නිදහස් මැදිරියක ගමන් කර ඇති විට හෝ විශේෂ වරප්‍රසාද සොදා ඇති මැදිරියක ගමන් කිරීමේ වරදක් සම්බන්ධයෙන්, එසේ ගමන් කර අසුවූ පුද්ගලයෙකු සතු බඩු භාණ්ඩාදිය හෝ වෙන්දේසියේ විකුණා මුදල් අයකර ගැනීමට දුම්රිය සාමාන්‍යාධිකාරීවරයාට බලය පැවරෙන අතර එසේ යම් ආකාරයකින් මුදල් අයකර ගැනීමට නොහැකි වන අවස්ථාවලදී නීති මගින් අයකර ගැනීමේ බලය සතුය.

ධාවනය වෙමින් තිබෙන දුම්රියකට නැඟීමට නැත් කිරීම හෝ පාපුවරුවේ ගමන් කිරීමේ වරදට දඩ ගැසීම 09

ධාවනය වෙමින් තිබෙන දුම්රියකට ගොඩවීම හෝ බැසීම එසේ ධාවනය වෙමින් තිබෙන දුම්රියකට ගොඩවීමට හෝ බැසීමට උපකාර වීම, පාපුවරුවේ ගමන් කිරීම හෝ ගමන් කිරීමට පිළියෙල කර ඇති මැදිරියක හැර අන් කිසිම ස්ථානයක ගමන් කිරීම දඬුවම් ලැබිය යුතු වරදකි. එවැනි වරදක් වෙනුවෙන් රුපියල් 20/- නොඉක්මවූ දඩයකට යටත් වේ.

දුම්පානය හා බුලත් හැපීම තහනම්ය 10

දුම්රියෙන් ගමන් කරන විට අන් මගීන්ට කරදරයක් වන අයුරින් දුම්පානයෙන් හා බුලත් හැපීමෙන් වැළකී සිටිය යුතුය. අබින් දුම්වැටි ආදිය පාවිච්චිකර වෙනත් මගීන්ට කරදර වන අයුරින් හැසිරීම, මැදිරිය වල දුම්රිය ස්ථානයේ කුණු ඇතිල්ලීම, බුලත් කෙළ ගැසීම, දඬුවම් ලැබිය යුතු වරදවල් ලෙස සැළකිය යුතුය. එවැනි වරදක් සදහා රු.20/- නොයික්මවූ දඩයකට යටත් වේ. අවවාද කිරීමෙන් පසුවද මෙවැනි වරදවල් වල යෙදෙන මගීන් දුම්රියෙන් ඉවත් කිරීමේ බලය දුම්රිය කාර්යමණ්ඩලය සතු වන්නේය. එවැනි අවස්ථාවලදී ගෙවන ලද ගාස්තු (ටිකට් පතේ මුදල්) ආපසු නොගෙවේ.

**වසූරිය වැනි බෝවන රෝගයන් ගෙන් පෙළෙන අයට දුම්රියෙන් ගමන් කිරීමට ඉඩ දෙනු නොලැබේ.**

11 වසූරිය වැනි බෝවන රෝගියකු දුම්රියෙන් ගමන් කිරීම දඩුවම් ලැබිය යුතු වරදකි. ඒ සඳහා ගෙවිය යුතු දඩය රුපියල් 50/- නොයික්මවේ. යම් විදිහකට එවැනි රෝගයකින් පෙළෙන්නෙකු දුම්රියේදී හසුවූ විටක, වහාම ඔහු ඉවත් කිරීමේ බලය දුම්රිය කාර්ය මණ්ඩලයකු වන්නේය.

**බීමත්ව හැසිරීම හෝ වෙනත් අයට කරදරයක් වන ලෙසට හැසිරීම සඳහා දඩ**

(2005 අංක 12 දරණ දඩ මුදල් වැඩි කිරීමේ පනතින් දඩ මුදල රු.1000/- කට නොඅඩු රු.2000/- නොඉක්මවන දඩයකට යනුවෙන් සංශෝධනය කර ඇත.

12 යම් පුද්ගලයෙක් බීමත් ගමින්, අසභ්‍ය ලෙස ඇඳ පැළඳ සිටීමෙන්, වෙනත් ගමන් ගන්නා මගීන්ට කරදරයක් වන අයුරින් හැසිරෙමින් දුම්රිය මැදිරියක හෝ දුම්රිය ස්ථානයකට අයත් වෙනත් ස්ථානයක රැඳී සිටීම දඩුවම් ලැබිය යුතු වරදක් ලෙස සැලකේ. එවැනි වරදක් සඳහා රුපියල් 50/- නොයික්මවූ දඩයකට යටත් වන අතර, මාස තුනකට නොවැඩි සිර දඬුවමකට හෝ ඒ දෙකටම යටත් වන අතර, අවශ්‍ය විටකදී දුම්රිය මැදිරියෙන් හෝ ස්ථානයෙන් බලෙන් හෝ ඉවත් කිරීමේ බලය කාර්ය මණ්ඩලය සතුවේ.

**පුද්ගලික කාමරවල හෝ මැදිරිවල අවසරයක් නොමැතිව ඇතුළුවීමේ වරදට දඩ**

13 විශේෂ මැදිරියක් මැදිරියක කොටසක් හෝ දුම්රිය කාමරයක් යම් පන්තියක් වෙනුවෙන් වෙන් කර ඇති විටෙක, දැන දැනම එහි ඇතුළු වීම/රැඳී සිටීම/ සිටවීම, ප්‍රයෝජන කිරීම, වෙන් කර ඇති අසුනක වාඩිවීම, අදාළ පන්තියක් සඳහා වෙන් කර ඇති විටෙක එහි ගමන් කිරීම දඩුවම ලැබිය යුතු වරදකි. ඒ වෙනුවෙන් රුපියල් 100/- නොයික්මවූ දඩයකට යටත් වේ. එමෙන්ම බලය යොදා ඉවත් කිරීමේ බලය දුම්රිය කාර්ය මණ්ඩලය සතුවේ.





**දුම්රිය එන්ජිම, දුම්රියට සවිකළ බක්කිය, ලගේජ් වැන් රථයෙහි ගමන් කිරීමට දඩ**

14 එන්ජින්කරු ගිනිකරු සහ උප ගිනිකරු හැරුණු විට දුම්රිය සාමාන්‍යාධිකාරීගේ විශේෂ අවසරයක් නොමැතිව අන් අයට දුම්රිය එන්ජිමක හෝ ගල් අඟුරු බක්කියක ගමන් කිරීම, දඩුවම් ලැබිය හැකි වරදකි. එමෙන්ම බ්‍රේක්මන් හෝ දුම්රිය නියාමක හැරුණු විට දුම්රිය සාමාන්‍යාධිකාරීගේ විශේෂ අවසරයක් නොමැති අය විසින් ලගේජ් වැන් රථයක, බඩු වැන් රථයක හෝ මගීන් ගෙන යන මැදිරියක හැරුණු විට අන් මැදිරියක ගමන් කිරීම දඬුවම් ලැබිය යුතු වරදක් වන අතර එම වරද සඳහා රුපියල් 50/- නොයික්මවූ දඩයක් ගෙවිය යුතු වේ.

**දුම්රියෙන් ප්‍රවාහනයේදී නැතිවූ පළුදුවූ බඩු වෙනුවෙන් වන්දි ගෙවීම**

15 (1) තම නිලධාරීන්ගේ වරදින් හෝ අපරීක්ෂාකාරීකමින් සිදුවූ නැතිවීමක්, විනාශවීමක් හෝ පළුදුවීමක් නොවේ නම් දුම්රියෙන් බඩු ප්‍රවාහනයේදී සිදුවී ඇති එවැනි පාඩුවක් සඳහා දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ. එමෙන්ම එසේ වන්දි ඉල්ලා සිටින බඩු වලට අදාළ ලදුපතෙහි ලිපිනය පැහැදිලිවම සඳහන් කර තිබිය යුතු අතර, මෙම ආඥා පනතේ සඳහන් අවශ්‍යතාවන් සපුරා තිබිය යුතුවාක් මෙන්ම ප්‍රවාහන ගාස්තු ගෙවා තිබිය යුතුය.

(2) රජය විසින් අදාළ පාඩුව දැරීමට සිදුවන අවස්ථාවලදී අලාභය ගෙවනු ලබන්නේ පහත සඳහන් කොන්දේසි වලට යටත්වය.

(අ) නියම කර ඇති වන්දිය නොයික්මවූ ප්‍රමාණය.

(ආ) වන්දි ප්‍රමාණය නියම කර නොමැති කල්හි, දුම්රිය භාර දෙන අවස්ථාවේ බඩුවල සාමාන්‍ය වටිනාකම නොයික්මවූ ප්‍රමාණයක්.

එසේ වුවද:-

(i) බඩුවල වැඩි ආරක්ෂාව සඳහා වැඩිපුර ආරක්ෂණ මුදලක් ගෙවා ඇති කල්හි, ඒ මත තක්සේරු මුදල,

(ii)වන්දි ගෙවීමක් සඳහන් වීමට හෝ සුදුසු වන්දියක් ගෙවීමට රජයට ඇති බලය මෙහි

| | | |
|---|---|---|
| | | ඉහත කොන්දේසි වලින් පාලනය නොවන්නේය. (iii) වන්දියට යටත් වන බඩුවල වටිනාකම ඔප්පු කිරීමේ වගකීම වන්දි ඉල්ලුම්කරු සතු වන්නේය. |
| ප්‍රවාහනයේදී නැති වූ බඩුවලට වන්දි ඉල්ලීම හෝ වැඩිපුර අයකිරීම ලබා ගැනීම (1950 අංක 18) | 16 | පහත දැක්වෙන අවස්ථාවලදී හැර දුම්රියෙන් බඩු ප්‍රවාහනය කිරීමේදී සිදුවන බඩු නැතිවීම, බඩුවලට සිදුවන අලාභහානි සඳහා වන්දි ආපසු ආපසු ලබාගැනීමඉල්ලීම, හෝ වැඩිපුර අයකරනු ලබන ගාස්තු ආපසු ලබා ගැනීමට කිසිම පුද්ගලයෙකුට හිමිකමක් නැත්තේය. (අ) පිටරටින් ගෙන්වනු ලබන යම්කිසි ද්‍රව්‍යයක් දුම්රියෙන් ප්‍රවාහනය කරවා දීමට කලෙලිමන්තාරමේ දී භාරගෙන ඇති කල්හි එම බඩු ප්‍රවාහනය කර ගැනීමට ලිඛිත ඉල්ලීමක් දුම්රිය සාමාන්‍යාධිකාරී වෙත ඉදිරිපත් කර ඇති විටෙක, එසේ බඩු භාරගත් මාස 06 ක් ඇතුළත ප්‍රවාහනය කර දිය යුතුය. (ආ) ඉහත (අ) ඡේදය යටතේ නොවැටෙන බඩු සම්බන්ධයෙන් වූ විට අදාළ කාල සීමාව මාස 02 ක් ඇතුළත් වේ. |
| කොන්දේසි වලට යටත්ව භාරගත් බඩු | 17 | ප්‍රවාහනය සඳහා භාරගත් බඩු, සතුන් හා අනෙකුත් ද්‍රව්‍ය විළඹ දුම්රියෙන් ප්‍රවාහනය කිරීමට බැරි නැතිනම් එසේ ප්‍රවාහනය කරනු ලබන්නේ පැවතීමට ප්‍රමාණවත් කාලයක් තිලව කර, බඩු දුම්රියවල ඇති ඉඩ ප්‍රමාණය ආදී කරුණු සම්පූර්ණ වූවාට පසුවය. |
| අන්තරාදායක බඩු ප්‍රවාහනය කිරීම, (2005 අංක 12 දරණ දඩ මුදල් වැඩි කිරීමේ පනතින් දඩ මුදල රු.1000/- කට නොඅඩු රු.1500/- නොඉක්මන දඩයක් ලෙස සංශෝධනය කර ඇත.) | 18 | දුම්රියෙන් අන්තරාදායක බඩු ප්‍රවාහනය කිරීම, එසේ දුම්රිය සේවකයෙකු / නිලධාරියෙකු ලවා ප්‍රවාහනය කරවීම, යවනු ලබන දුම්රිය ස්ථානයේ ස්ථානාධිපතිගේ දැනගැනීම සඳහා එහි සලකුණු නොකිරීම දඬුවම් ලැබිය යුතු වරදකි. ඒ සඳහා රුපියල් 200/- කට නොවැඩි දඩයකට යටත් වේ. තවද එවැනි අන්තරාකාරී ද්‍රව්‍යයක් ප්‍රවාහනය කරවීම ප්‍රතික්ෂේප කිරීමට දුම්රිය බලධාරීන්ට පුළුවන. නොඑසේ නම් එය විවෘත කර සැබීමකට පත්විය යුතුය. |





| | | |
|---|---|---|
| ඉල්ලූ විටක ප්‍රවාහනය කරනු ලබන බඩු වල විස්තර ලබා දිය යුතුය | 19 | ප්‍රවාහනය සඳහා භාර දීමට ඇති/ භාරදී ඇති පාර්සලයේ අඩංගු ද්‍රව්‍යවල විස්තර වටිනාකම, ප්‍රමාණය ආදී කරුණු දුම්රිය නිලධාරීන් විසින් ඉල්ලුම් කළ විට යවන්නා විසින් භාර දිය යුතුය. |
| යවන බඩුවල විස්තර නොදීම/ වැරදි විස්තරදීම සම්බන්ධයෙන් දඩය | 20 | දුම්රිය සේවකයෙකු විසින් යවනු ලබන බඩු සම්බන්ධ විස්තර ඉල්ලූ කල්හි ඒවා නොසැපයීම හා වැරදි විස්තර සැපයීම සම්බන්ධයෙන් ටොන් 1 කට වැඩි බරක් ඇති ද්‍රව්‍ය වූ කලී රුපියල් 50/- නොඉක්මවූ දඩ මුදලක්ද, ඊට අඩුවන විට රුපියල් 20/- ක දඩ මුදලක්ද, ගෙවිය යුතුවේ. |

(2005 අංක 12 දරණ දඩ මුදල් වැඩි කිරීමේ පනතින් "සෑම බඩු ටොන් 1 ක් සඳහාම රුපියල් 2000/- කට නොඅඩු සහ රු: 5000/- ක් නොඉක්මවන දඩයකට සහ ටොන් 1 කට අඩු නම් රු.1000/- කට නොඅඩු රු.3000/- ක් නොඉක්මවන දඩයක්" ලෙස සංශෝධනය කර ඇත.)

| | | |
|---|---|---|
| දුම්රියෙන් ප්‍රවාහනය සඳහා භාරදුන් බඩුවල ප්‍රවාහන ගාස්තු ගෙවීම පැහැර හැරීම. | 21 | දුම්රියෙන් ප්‍රවාහනය සඳහා භාර දෙන යම් ද්‍රව්‍යයක්, සතුන්, පාර්සල් වැනි දේ සඳහා නියමිත කරන ලද ගාස්තුව නොගෙවා තිබූ විට, ප්‍රවාහනය සඳහා භාර දුන් පුද්ගලයාට දන්වා ගෙවීම කළ යුතුමක් පැහැරහරින්නේ නම් එම ද්‍රව්‍ය /සතුන් ආදිය රඳවාගෙන දුම්රිය සාමාන්‍යාධිකාරීගේ අභිමතය පරිදි වෙන්දේසියේ විකුණා (එම ප්‍රමාණය හෝ කොටසක්) ප්‍රවාහන ගාස්තු ආදිය අයකර ගෙන ඉතිරි මුදල්/ද්‍රව්‍ය භාරදෙන ලද පුද්ගලයා වෙත භාරදීමේ බලය දුම්රිය සාමාන්‍යාධිකාරී සතු වන්නේය. |
| රේගු ගාස්තු අයකර ගැනීම සඳහා පිටරටින් ගෙන්වා දුම්රියෙන් ප්‍රවාහනය කිරීම සඳහා කලෙලිමන්තාරමෙන් භාර ගන්නා ලද බඩු පරීක්ෂා කර බැලීම | 22 | (1)කලෙලිමන්තාරම දුම්රිය පොලට ලැබෙන පිටරටින් ගෙන්වන ලද සියළු බඩු රේගු ආඥා පනත යටතේ ගාස්තු අයකර ගැනීම සඳහා ප්‍රධාන රේගු පාලක විසින් තීරණය කරනු ලබන ස්ථානයකදී පරීක්ෂා කර බැලීමක් ඊට අදාල නීති පැනවීමක් කරනු ලැබේ. |

(2) එසේ ලැබෙන සියළුම බඩු පාර්සල් හෝ වෙනත් ද්‍රව්‍යයක් රේගු පාලකගේ නියෝජිතයෙකු ඉදිරිපිටදී විවෘත කර පරීක්ෂා කර බැලීමට දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් පත්කරනු ලබන නිලධාරියෙකුට තීරණය කරනු ලබන ඕනෑම දුම්රිය ස්ථානයකදී සුදුසුවන.

(3) එසේ පරීක්ෂා කරනු ලබන මගී බඩු පාර්සල් හා වෙනත් ද්‍රව්‍යයන් ඉදිරිපත් කර ඇති ප්‍රකාශන පෝරමයේ බිල්පතේ සඳහන් ආකාරයට ගැලපේ නම් නැවත ඒවා රේගු නිලධාරී ඉදිරිපිටදීම පාර්සල් කර ලැබිය යුත්තා වෙත ලැබීමට සැලැස්වීම දුම්රිය නිලධාරීන් ගේ යුතුකමකි.

(4) ඉහත සඳහන් ආකාරයේ වූ ද්‍රව්‍යයන් ගේ සත්‍යස්වරූප අඩුවෙන් සඳහන් කර තිබීම විශ්කර වැරදිව සඳහන් කර තිබීම හෝ ගෙන්වීමට අවසර නැති බඩුබවට රේගු නිළධාරියාට ඒත්තු ගැනීම යන කරුණු මත එම ද්‍රව්‍ය රඳවාගෙන තබාගෙන ප්‍රධාන රේගු පාලකගේ නියෝගයට ඉදිරිපත් කළ යුතුය. එම නියෝගය මත යම් දඩ මුදලක් ගෙවීම බඩු රාජසන්තක කිරීම අතිරේක ගෙවීමක් නියම කිරීම සිදු කළ හැක.

(5) ඉහත (4) වෙනි අනුඅංගුවට ගන්නා ලද ද්‍රව්‍යයන් සම්බන්ධයෙන් දුම්රිය සාමාන්‍යාධිකාරී දුම්රිය සාමාන්‍යාධිකාරීවරයා විසින් එම ද්‍රව්‍ය ය ලැබිය යුත්තා වෙත නිවේදනයක් යවමින් ඒවා ඉවත් කර ගන්නා ලෙසට දැනුම් දිය යුතුය.

(6) ඉහතින් දැක්වූ ක්‍රියා මාර්ගයන් අනුගමනය කිරීම හේතු කොටගෙන පාර්සල් විවෘත කිරීම සම්බන්ධයෙන් හෝ වෙනත් දීමනාවක් රජයෙන් හෝ දුම්රිය සාමාන්‍යාධිකාරීවරයාගෙන් ඉල්ලීමට ඉඩ නැත.





(7) ඉහත සඳහන් පරිදි රඳවාගත් බඩු ගබඩා කිරීමෙන් පසු ආපසු රැගෙන යන ලෙසට දන්වා දින 03 ක් ඇතුළත ඉවත් කර නොගත්තේ නම් එම බඩු යැවූ තැනැත්තාගෙන් හෝ ලැබිය යුත්තාගෙන් හෝ ගබඩා කිරීමේ ගාස්තු (විටින් විට නියම කරන පරිදි) අයකර ගත හැක.

මායිම් ගල්, මායිම් කණු සලකුණු වෙනස් කිරීම හා ගලවා දැමීම මත වූ දඩ (2005 අංක 12 දරණ දඩ මුදල් වැඩි කිරීමේ පනතින් රු.1000/- කට නොඅඩු රු.2000/- ක් නොඉක්මවන සංශෝධනය කර ඇත.)

23 දුම්රිය නිළධාරියෙකු විසින් හෝ මානක හා මායිම් නිලධාරියෙකු විසින් හෝ ඔහුගේ සේවකයෙකු විසින් දුම්රිය පාරක් සඳහා සලකුණු කර ඇති මායිම හෝ මායිම් මායිම් ගල් හෝ මායිම් කණු ගලවා දැමීම වෙනස් කිරීම දඬුවම් ලැබිය යුතු වරදකි. එවැනි වරදක් සඳහා වූ දඩය රුපියල් වශයෙන් 50 ක් නොඉක්මවේ.

දුම්රිය දේපල ආදියට හිතාමතාම හෝ නොසැලකිල්ලෙන් කරනු ලබන අලාභ සඳහා දඩ (2005 අංක 12 දරණ දඩ මුදල් වැඩි කිරීමේ පනතින් "රු.1000/- කට නොඅඩු නොඉක්මවන දඩ වශයෙන් සංශෝධනය ඇත.

24 (1) කිසිම හෝ පුද්ගලයෙකු හිතාමතාම හෝ නොසැලකිල්ලෙන් කමින් දුම්රිය ඇන්ජිමකට, මැදිරියකට, දුම්රිය ස්ථානයකට, ගබඩාවකට, පාලමකට, මාර්ගයකට, උමඟකට, ගොඩනැගිල්ලකට, යන්ත්‍රයකට හෝ ඕනෑම දුම්රිය දේපලකට අලාභහානි කිරීම පාඩු සිදු කිරීම මෙන්ම දුම්රිය මාර්ගවලින් ගල් වැලි රු.3000/- ක් ඉවත් කිරීම මාර්ගය අසල බැවුම් කඳු හෑරීම, යකඩ කෑලි කඩා දැමීම, පාරට ගස් කපා දමා අවහිර කර කිරීම, දුම්රිය මඟීන්ගේ ආරක්ෂාවට බාධා කිරීම, දඬුවම් ලැබිය යුතු වරදවල් වන්නේය. එවැනි වරදකට මාස තෙර 24 ක් හෝ රුපියල් 1000/- ක දඩමුදලක් හෝ වසර 20 කට නොවැඩි ඕනෑම කාලයකට සිර දඬුවම් නියම කිරීම යන දඬුවම් වලින් එකක් හෝ ඒම වැඩි ගණනක් නියම කළ හැක.

(2005 අංක 12 දරණ දඩ මුදල් වැඩි කිරීමේ පනතින් "රු.1000/- කට නොඅඩු රු.2000/-ක් නොඉක්මන දඩයකට වශයෙන් සංශෝධනය කර ඇත.

(2) කිසිම හෝ පුද්ගලයෙකු විසින් දුම්රිය දෙපාර්තමේන්තු වැටක්, කාප්පයක් හෝ ආරක්ෂිත වැටක් යන ඉද්ව හානි පැමිණවීම කඩා බිඳ දැමීම දඬුවම් ලැබිය යුතු වරදක් වන අතර එසේ සිදුකරනු ලබන වරදකට රුපියල් 50 ක් නොසික්ම වූ දඩයකට යටත් කළ හැක.

(3) කිනම් හෝ පුද්ගලයෙකු විසින් දුම්රිය පාරකට, දුම්රිය දේපලකට හානිවන පරිදි යම් ඇලක් වේල්ලක් හෝ වතුර පාරක් පාරට යැවීමෙන් එසේ වතුර යෑමකක් හේතුකොට ගෙන යම් අලාභ හානියක් සිදු කරන්නේ නම් එය දඬුවම් ලැබිය යුතු වරදකි. ඒ සඳහා දඩය රුපියල් 100 ක් නොයික්මවන්නකි.

(4) ධාවනය වන දුම්රියකට ගල් ගැසීම, මගීන්ට තුවාල සිදු කිරීම, දුම්රිය දෙපාර්තමේන්තුවට ගල් වැලි ගඩොල් ගනාදිය සැපයීමට කොන්ත්‍රාත් බාර ගෙන ඇති යම් පුද්ගලයෙක් එසේ සපයන ලද ද්‍රව්‍ය එක් රැස් කර තැබීමෙන්, ගොඩගසා තිබීමෙන්, දුම්රිය මාර්ගයට අලාභහානියක් සිදු කරන්නේ නම් හෝ දුම්රිය මාර්ගයට තෙල්. වැලි ලිස්සන ද්‍රව්‍ය යෙදීම දඬුවම් ලැබිය යුතු වරදකි. දඬුවම් දඩය රුපියල් 50/- කි. ඊට අමතරව දුම්රිය මාර්ගයට සිදුවන අලාභය ගෙවිය යුතුය.

**දුම්රිය ස්ථානවල ප්‍රසිද්ධ කර ඇති දැන්වීම් /ලියවිලි ආදිය ඉවත් කිරීමේ දඩ (2005 අංක 12 දරණ දඩ මුදල් වැඩි කිරීමේ පනතින් "රු.1000/- නොඅඩු රු.3000/-ක් නොඉක්මවන දඩයකට වශයෙන් සංශෝධනය කර ඇත.)** 25

යම් පුද්ගලයෙක් විසින් දුම්රිය නිළධාරීන් විසින් මෙහි 42 වෙනි නියෝගය අනුව ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් හෝ ලියවිලි ඉවත් කිරීම දඬුවම් ලැබිය යුතු වරදක් වන අතර කිරීමේ රු.50/- ක් නොඉක්මවූ දඩයකට හෝ තුන් මසක කට සිර දඬුවමකට යටත් වන්නේය.

**දුම්රිය එන්ජින්/මැදිරිවලට අවහිර කිරීම හෝ මගීන්ගේ ආරක්ෂාවට බාධා පැමිණවීම, (2005 අංක 12 දරණ දඩ මුදල් වැඩි කිරීමේ පනතින් "රු.1000/- කට නොඅඩු රු.3000/-ක් නොඉක්මවන දඩයකට වශයෙන් සංශෝධනය කර ඇත )** 26

යම් පුද්ගලයෙකු විසින් හිතාමතා හෝ ද්වේශ සහගතව ගල් මුල් හරස්කොට පිලි ගලවා සිග්නල් වයර් ආදී ධාවනයට උපකාරී වන වෙනත් උපකරණවලට අලාභහානි කර දුම්රිය ධාවනයට අවහිර කරන්නේ නම් හෝ එම නිසා මගීන්ගේ ජීවිතවලට තර්ජනයක් කරන්නේ නම්/ කිරිහැරයක් ඇති කරන්නේ නම් එය දඬුවම් ලැබිය යුතු වරදකි. එවැනි අවස්ථාවලදී දඬුවම් වශයෙන් කස පහර 24 ක්ද දිය හැකි වන අතර වසර 20 දක්වා ඕනෑම කාලයකට සිර දඬුවමක් හෝ එම දඬුවම් සියල්ල නියම කළ හැක.





**දුම්රිය ධාවනයේදී හිතාමතා හෝ ද්වේශසහගතව සිදුකරනු ලබන අඩු සාඩු හේතු කොටගෙන මගීන්ගේ ජීවිතවලට තර්ජනයක් ඇති වන විට (2005 අංක 12 දරණ දඩ මුදල් වැඩි කිරීමේ පනතින් "රු.1000/- නොඅඩු රු.3000/-ක් නොඉක්මවන දඩයකට වශයෙන් සංශෝධනය කර ඇත )** 27

කවුරුන් විසින් හෝ දුම්රිය ධාවනයේදී හෝ ද්වේශ සහගතව හෝ සිදු කරනු ලබන අඩුසාඩු හේතු කොටගෙන ගමන් ගන්නා මගීන්ගේ ජීවිතවලට යම් අවහිරයක් ඇති කරන්නේ නම් එවැනි අඩුපාඩු සිදු කිරීම මත ශාරීරික දඬුවම් වශයෙන් කස පහර 20 ක් හෝ රුපියල් 200/- ක දඩයක් හෝ අවුරුදු 07 කට කට නොවැඩි සිරදඬුවමක් හෝ සියල්ලම පැනවිය හැක.

**නොසැලකිලිමත්කම හෝ හදිසි ක්‍රියාවලට දඬුවම (2005 අංක 12 දරණ දඩ මුදල් වැඩි කිරීමේ පනතින් "රු.1000/- කට නොඅඩු රු.3000/-ක් නොඉක්මවන දඩයකට වශයෙන් සංශෝධනය කර ඇත )** 28

කිනම් පුද්ගලයෙකු විසින් හදිසි ක්‍රියා හෝ නොසැලකිලිමත්කම නිසා තමාට හෝ දුම්රියෙන් ගමන් ගන්නා අනෙකුත් පුද්ගලයින්ට හෝ හානිදායක ක්‍රියාවක් සිදුකරන්නේ නම් එම කැනැත්තා දඬුවම් ලැබිය හැකි වරදක් කළා සේ සැලකේ. එවැනි වරදකට 06 මසකට නොවැඩි සිර දඬුවමක් හෝ රු.100/- කට නොවැඩි දඩයකට හෝ එම දඬුවම් දෙකටම යටත් විය යුතුය.

**දුම්රිය සේවකයින්ගේ බීමත්කම නිසා හෝ රාජකාරී පැහැරහැරීම නිසා හෝ හේතුව මත පනවනු ලබන නඩු** 29

බීමත්කමින් හෝ නොසැලකිලිමත්කමින් දුම්රිය සේවකයෙකු තම රාජකාරී පැහැර හරින්නේ නම් හෝ එසේ පැහැර හැරීම හේතුව හේතුවෙන් ගමන් ගන්නා මගීන්ගේ ජීවිත වලට යම හානියක් සිදුවන්නේ නම් එය දඬුවම් ලැබිය යුතු වරදක් වන්නේය. දඬුවම් වසරකට නොවැඩි සිර දඬුවමක් හෝ රු.200/- නොයික්මවූ දඩයක් හෝ එම දඬුවම් දෙකටම යටත් වන්නේය.

**නීති කඩ කිරීම** 30

යම් පුද්ගලයෙකු විසින් ඇමතිතුමා / විසින් අනුමත කර ඇති යම් නීතියක් / රෙගුලාසියක් හිතාමතාම කඩකරන්නේනම් හැකි නම් නීතියට පටහැනිව ක්‍රියා කරන්නේ නම් එය දඬුවම් ලැබිය යුතු වරදක් වන අතර රු.20/- ක් නොඉක්මවූ දඩයකට යටත් වන්නේය.

**බලහත්කාරයෙන් ඇතුළු - වීමට දඬුවම**
(1983 අංක 49 දරණ පනතින් 31 (අ), 31(ආ),31(ඇ),සහ 31(ඈ) වශයෙන් අළුතින් වගන්ති ඇතුළත් කොට ඇත. එම වගන්තිවලට අයත් දඩමුදල් 2005 අංක 12 දරණ දඩ මුදල් වැඩිකිරීමේ පනතින් සංශෝධනය කර ඇත.)

31 යම් පුද්ගලයෙකු විසින් බලහත්කාරයෙන් දුම්රිය ස්ථානයට, දුම්රිය දේපලකට හෝ දෙපාර්තමේන්තුවකට අයත් වෙනත් ස්ථානයකට බලහත්කාරයෙන් ඇතුළු වීම දඩුවම් ලැබිය හැකි වරදකි. එවැනි අවස්ථාවලදී දුම්රිය නිලධාරීන්/බලයලත් පුද්ගලයින් විසින් දැන්වූ පසුවද ඉවත් නොවීම දඩුවම් ලැබිය යුතු වරදකි. ඒ මත රු.50/- නොඉක්මවූ දඩයක් පැනවිය හැකි අතර දුම්රිය නිලධාරියෙකු විසින් හෝ බලයලත් නිලධාරියෙකු විසින් බලෙන් ඉවත් කිරීමට යටත් වන්නේය.

**දුම්රිය හරස් මාර්ග සඳහා ආරක්ෂාව**

32 ප්‍රසිද්ධ මාර්ගයක් හරහා දුම්රිය මාර්ගයක් වැටී ඇති අවස්ථාවන්හිදී දුම්රිය සාමාන්‍යාධිකාරී වරයා විසින් දුම්රිය මාර්ගයට ගේට්ටුවක් සවි කිරීමට කටයුතු කළ යුතු අතර, දුම්රිය ධාවනය නොවන අවස්ථාවලදී එය වසා තැබිය යුතුය, එසේ වුවද එවැනි ගේට්ටුවක් පාරහරහා ඉදිකිරීමට ඇමති වරයාට බලය තිබේ. එවැනි අවස්ථාවලදී එය ඉදිකිරීම, නඩත්තු කිරීම හා වැසීම හා විවෘත කිරීම හා සම්බන්ධ සියළු කටයුතු කළ යුතුයි.

**සුළු හරස් මාර්ග**

33 (1) ඇමතිවරයා විසින් "සුළු හරස් මාර්ග" වශයෙන් හඳුන්වනු ලබන හරස් මාර්ග අවශ්‍ය අවස්ථාවල දී වසා තැබීමට හෝ විවෘත කිරීමට නියෝග කරනු ලැබේ. එම බලය ඔහු සතු වන්නේය.
(2) අතුරු පාරවල් හරහා ඇති දුම්රිය මාර්ගවලට අදාළ "සුළු හරස් මාර්ග" සඳහා වූ ගේට්ටු යතුරු යොදා වසා තැබිය යුතු අතර, එහි යතුර දුම්රිය සාමාන්‍යාධිකාරවරයා විසින් බල ඇවරෙන ලැබූ තැනැත්තෙකු භාරයේ තබා ගත යුතුය
(3) එසේ වසා තබනු ලබන ගේට්ටුවක් විවෘත කරවා ගැනීමට අවශ්‍ය විටක උනන්දුවක් දක්වන පුද්ගලයා විසින් ලිඛිත ඉල්ලීමක් කර එය ඉටුකර ගත යුතුය.
(4) දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් දුම්රිය ධාවනය වන වේලාවන් සඳහන් කාල සටහන





බලයලත් පුද්ගලයින්ට ලබා දිය යුතු අතර ගේට්ටුව විවෘත කරන අවස්ථාවන් වලදී දුම්රියක් ධාවනය නොවන බවට හෝ පෙනෙන තෙක්මානයේ නොමැති බවට සෑහීමකට පත්විය යුතුය.
(5) ගවයන් දක්වාගෙන යාමේදී ද, එම තිරිසන් සතුන් එහාමෙහා දක්කාගෙන යාමට පුද්ගලයෙකු සිටිය යුතුය.
(06) ඉහත ආකාරයෙන් වසා ඇති ගේට්ටුවක් නොදැන්වා විවෘත කිරීම හෝ බලහත්කාරයෙන් ගවයන් එහාමෙහා එලවා දැමීම දඩුවම් ලැබිය හැකි වරදකි. ඒ සඳහා දඩුවම් වශයෙන් රු.50/- කට නොවැඩි දඩයක් හෝ මාස 03 ක සිර දඩුවමකට යටත් වේ.
(07) දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් යතුරු භාර දෙනු ලැබූ පුද්ගලයෙකු ගේට්ටු විවෘත කර ඇතිය යුතු අවස්ථාවලදී හැර අන් අවස්ථාවලදී ඒවා වසා තැබීමට අපොහොසත් වීම දඩුවම් ලැබිය යුතු වරදකි. එවැනි වරදකට රු.50/- නොඉක්මවූ දඩයකට යටත්වේ.
(08) දුම්රිය සුළු හරස් මාර්ග සඳහා ආරක්ෂිත ගේට්ටු සවිකිරීම, පයින් ගමන් ගන්නා අය හට අවශ්‍ය පහසුකම් සපයා දීමට කටයුතු කිරීම දුම්රිය සාමාන්‍යාධිකාරී සතු වගකීමකි.

**දුම්රිය ස්ථාන සඳහා වූ මාර්ග**

34 (1) තමාට වූ කැපී පුද්ගලික පාවිච්චිය සඳහා වූ හරස් මාර්ග හරස් කොට වැටී ඇති දුම්රිය මාර්ගයන්ට සම්බන්ධවී පවතී. එවැනි පුද්ගලික මාර්ග සඳහා වූ ගේට්ටු වැසිය යුත්තේ, එම පාර හරහා මිස දුම්රිය මාර්ග හරහා නොවේ. මෙම ගේට්ටුවල යතුරු අයිතිකරුවන් විසින් ම තබා ගනු ඇත.
(2) පදිංචි ස්ථානයක් සඳහා හරස් මාර්ගයක් ලබා ගත් පුද්ගලයා විසින්, එය නිසි ලෙස පාවිච්චි කිරීමේ වගකීම එම පුද්ගලයා සතු වගකීමක් වන අතර, වගකීම පැහැරහැරීම දඩුවම් ලැබිය හැකි වරදකි. දඩුවම රු.50/- නොඉක්මවූ දඩයකි.
(3) මෙම හරස් මාර්ගයක් හේතු කොට සිදුවන හානි හෝ අලාභ වලට රජය වග කියනු නොලැබේ.

(4) මෙම හරස් ගේට්ටු හා දුම්රිය මාර්ග දෙපස වැටවල් නඩත්තු කිරීමට දුම්රිය සාමාන්‍යාධිකාරී පියවර ගන්නා අතර, හරස් ගේට්ටුව ලබා ගෙන ඇති පුද්ගලයාගේ නොසැලකිලිමත්කමකින් එම ගේට්ටුව හෝ දුම්රිය දේපලකට අලාභ හානියක් සිදු වුවහොත් , එය ඔහු විසින් දැරිය යුතුය.

(5) මෙවැනි පදිංචි ස්ථානයකට සම්බන්ධ දුම්රිය හරස් මාර්ග ලබා දෙනු ලබන්නේ දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් නියම කරනු ලබන කොන්දේසි වලට යටත් වන අතර, ඒවා ඉදිකිරීම් ගාස්තු හා වාර්ෂික නඩත්තු කිරීමේ ගාස්තු එම පුද්ගලයා විසින් ගෙවිය යුතුය.

(6) මෙම ආඥා පනත ප්‍රසිද්ධ කරනු ලබන අවස්ථාවේ දී මෙසේ හඳුන්වනු ලැබූ දුම්රිය හරස් මාර්ග සියල්ල පවත්නා නීතියට යටත් වනු ඇත.

(7) ඉහත ආකාරයෙන් එසේ ලබා දෙනු ලැබූ හරස් මාර්ගවලට සම්බන්ධ කොන්දේසි හරි හැටියෙන් ඉටු නොවන බවට දුම්රිය සාමාන්‍යාධිකාරීවරයාට හැඟී යන්නේ නම්, එවැනි අවස්ථාවලදී දුම්රිය දෙපාර්තමේන්තු සේවකයෙකුගේ සේවය යොදා ඒවා සක් කළ හැකි වන අතර, ඒ සඳහා වැය වන මුදල දුම්රිය හරස් මාර්ග ඉල්ලුම් කළ පුද්ගලයා විසින්ම දැරිය යුතුය.

ගේට්ටු විවෘත කිරීම සදහා දඩ 35

(1) එසේ කිරීමට ඉඩසලසා තිබෙන සීමාව හැර දුම්රිය මාර්ගයක් දිගේ හෝ හරහා සතුන් එලවා ගෙනයාම දඬුවම් ලැබිය යුතු වරදකි. එවැනි වරදක් සඳහා රුපියල් 50/- ක් නොඉක්මවූ දඩයක් අය කළ හැක.

(2) දුම්රිය ධාවනය වීම ආසන්න වීම හේතුවෙන් යම් ගේට්ටුවක් වසා තබන විට, එය නොතකා සතුන් එලවීමට, සතුන් එහා මෙහා ගෙනයාම සඳහා ගේට්ටුවක් විවෘත කිරීම දඬුවම් ලැබිය හැකි වරදකි. එවැනි වරදක් සඳහා රුපියල් 100/- නොඉක්මවූ දඩයකට යටත් වේ.





දුම්රිය මාර්ග උඩින් හෝ ඒ අවට ගවයන් වැනි සතුන් ගමන් කරවීම,හැසිරෙන්නට ඉඩ දීම සම්බන්ධව දඬුවම් පැමිණිය හැකි වරදකි 36

ගවයෙකුගේ හෝ එවැනි සතෙකුගේ අයිතිකරුවන්ට අයිතිකරුවෙක්, දුම්රිය මාර්ගය හරහා හෝ ඒ අවට සැරිසැරීමට ඉඩදීම, සම්බන්ධව එම හිරිසත් සතා දුම්රිය සේවකයෙකුට එලවා ගොස් මහේස්ත්‍රාත් අධිකරණයක් වෙත ඉදිරිපත් කර අයිතිකරුට දඬුවම් පැනවිය හැකිය. දඩය ගෙවීමට අපොහොසත් වන්නේ නම් එම සතා/සතුන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා දඩ මුදල් අයකරගෙන ඉතිරි මුදල් අයිතිකරු වෙත භාර දිය හැක. (රඳවා තැනීම, සතාට කෑම දීම, හා අනෙකුත් වියදම් ද අඩු කරගෙන )

37 මෙම ආඥා පනතේ සෑම රෙගුලාසියකින්ම අපේක්ෂා කරනුයේ මහජන සුරක්ෂිත භාවයයි. ඒ අනුව එම අපේක්ෂාවන් මුදුන්පත් කර ගැනීම සඳහා සෑම දුම්රිය සේවකයෙකුම එම රෙගුලාසි වලට බැඳී සිටියි.

වරදකරුවන් අත්අඩංගුවට ගැනීම. 38

(1) මෙම ආඥා පනත යටතේ සිදුකරනු ලබන ඕනෑම වරදක් සම්බන්ධවත්, වරදකරු අත්අඩංගුවට ගැනීමට, පවත්වා නීතිය යටතේ පොලිසියේද සහය ඇතිව හෝ එසේ කිරීමට දුම්රිය නිලධාරීන්ට බලය ඇති අතර, එවැනි වරදකරුවන් මහේස්ත්‍රාත් අධිකරණයක් වෙත පමුණුවා සාමාන්‍ය නීතිය යටතේ නඩු පැවරිය හැක.

එම අවස්ථාවට දුම්රිය නිලධාරියෙකුට එවැනි වරදක් කළ පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන බැඳුම්කරයකට යටත් කොට පසුව අවශ්‍ය විටක මහේස්ත්‍රාත් අධිකරණයක් වෙත පෙනී සිටීමට හැකි වන සේ මුදා හැරිය හැක.

1998 දුම්රිය (සංශෝධන - පනතින් 31(2) වගන්තිය සංශෝධනය කර ඇත.

(2) තවද දුම්රිය ස්ථානාධිපති / දුම්රිය නියාමක වැනි නිලයන්ට පහත් ශ්‍රේණියක් නොවන නිලයක් දරණ දුම්රිය නිලධාරියෙකුටද අපරාධ නඩු විධාන සංග්‍රහයේ කෙසේ සඳහන් වී තිබුණද දුම්රියකදී හෝ දුම්රිය

සාමාන්‍යාධිකාරීගේ පාලනය යටතේ ඇති ස්ථානයකදී ඕනෑම පුද්ගලයෙකු වරෙන්තුවක නොමැතිව අත්අඩංගුවට ගෙන පවත්නා නීතිය යටතේ අවශ්‍ය කටයුතු කිරීම සඳහා පොලිස් නිලධාරියෙකුට භාර කිරීමේ අයිතිය තිබේ.

**මහේස්ත්‍රාත් බල ප්‍රදේශය** 39

පවත්නා සාමාන්‍ය අධිකරණ බල ප්‍ර දේශයට අමතරව, අධිකරණ අමාත්‍යවරයාගේ නියෝගයකට යටත්ව, මෙම ආඥා පනත යටතේ, සිදු කරනු ලබන වැරදි සම්බන්ධයෙන් බල ප්‍රදේශය නොසලකා කටයුතු කිරීමට මහේස්ත්‍රාත්වරුන්ට බලය තිබේ.

**තමන්ගේ විෂය පථකට නොවැටෙන නඩු සම්බන්ධ කටයුතු කිරීමට මහේස්ත්‍රාත්වරුන්ට දෙනු ලබන බලය** 40

මෙම ආඥා පනත යටතේ වරදක් කරනු ලැබූ පුද්ගලයෙකු සම්බන්ධයෙන්,එම වරදේ ස්වභාවයට අදාල දඬුවම අදාළ මහේස්ත්‍රාත් උසාවියේ විෂය පථයට නොගැලපුනාත් ඇටෝර්නි ජෙනරාල් වරයාගේ සහතිකයක් සමඟ ගොනුකල කල්හි එම මහේස්ත්‍රාත් වරයාට නඩුව විභාග කිරීමටත්,දඬුවම් පැමිණවීමටත් බලය තිබේ.

**ආඥාපනතේ රෙගුලාසි කඩකිරීම මත අඩු වයස්කරුවන්ට දෙනු ලබන දඬුවම** 41

වයස අවුරුදු 16 ට අඩු ළමයින් විසින් මෙම ආඥා පනත යටතේ කරනු ලබන වරදවල් සම්බන්ධයෙන් දඬුවම පැමිණවීමට මහේස්ත්‍රාත් අධිකරණයට බලය ඇතත්, එවැනි අවස්ථාවලදී අවවාද කිරීම වැනි සුළු දඬුවම් පැමිණවීම කළයුතු වන්නේය.

**ආඥාපනතේ රෙගුලාසි භාෂා තුනෙන්ම ප්‍රසිද්ධ කිරීම හා පළ කිරීම.** 42

මෙම ආඥාපනතේ රෙගුලාසි, කාලසටහන් කලින් කලට ප්‍රසිද්ධ කරනු ලබන ගාස්තු ප්‍රමාණයන් මුද්‍රණය කර (භාෂා තුනෙන්ම) සෑම දුම්රිය ස්ථානයකම පැහැදිලිව පෙනෙන සේ ප්‍රදර්ශනය කරමින් මහජනයාගේ දැනගැනීමටසැලැස්විය යුතු වේ





**දුම්රියෙන් බඩු ප්‍රවාහනයේදී ගෙවනු ලබන අඩු කිරීම (සහන)** 43

දුම්රියෙන් බඩු ප්‍රවාහනයේදී ඕනෑම පුද්ගලයෙකුට හෝ සමාගමකට යම් කිසි ගාස්තු අඩු කිරීමක් ලබා දීමට අමාත්‍යවරයාට බල තිබේ.

**අර්ථ නිරූපනය** 44

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම ආඥා පනතෙහි

...............................

"බඩු " යන්නෙන් , යවන්නා හෝ ඔහුගේ නියෝජිතයා විසින් එකඟ වී ඉදිරිපත් කරන ලද ප්‍රේෂණ පත්‍රයේ අඩංගු වේ කොන්ත්‍රාත්තුවේ කොන්දේසි හා නියමයන් යටතේ බඩු පෙට්ටි වලින් හෝ මිශ්‍ර භාණ්ඩ රැගත් දුම්රියක් මඟින් ප්‍රවාහනය කිරීම පිණිස භාරගනු ලබන සියළුම වාණිජ බඩු යන්ත්‍රෝපකරණ , පෙට්ටි, ලේගර, ලෑලි පෙට්ටි සහ බඩු වර්ගීකරණයට ඇතුළත් වන සියළුම දේවල් හෝ ද්‍රව්‍යයන් අදහස් වේ.

# උප ලේඛණය

## මගී ප්‍රවාහනය

01)ගාස්තු ප්‍රමාණයන්

පළමු පංතිය - සැතපුමකට සත 20 කට නොවැඩි
දෙවන පංති - සැතපුමකට සත 10 කට නොවැඩි
තුන්වන පංතිය - සැතපුමකට සත 04 කට නොවැඩි, වශයෙන් වේ

02) මෙම ගාස්තු ප්‍රමාණයන් , ළමයින් , මාර්ග දර්ශකයන් හා තමා සමඟ යන සේවකයින් සම්බන්ධයෙන් වූ කලේහි මෙන්ම යාම් ඊම් හෝ වාර ප්‍රවේශපත්‍රයන් සම්බන්ධයෙන් වූ විට, අඩුවේ. ළමයින් සම්බන්ධ වූ විට මෙම ගාස්තු ප්‍රමාණය අඩුවීම ඔවුන්ගේ වයස හෝ උස ප්‍රමාණය අනුව මෙම නියෝගය යටතේ තීරණය කරනු ලබයි.
03) විශේෂ දුම්රිය හා වෙන් කරන ලද ආසන සඳහා විශේෂ ගාස්තුවක් අයකරනු ලබයි.
අශ්වයන්,ගවයන්, ඌරන්, බල්ලන් වැනි සතුන්ද ඇතුළුව මගී දුම්රිය වලට ඇඳන ලද බඩු වැගන් වලින් ප්‍රවාහනය කරනු ලබන අශ්ව, බග්ගි, රිය වර්ගවලට අයන් ප්‍රවාහන බඩු මූටවු සහ පාර්සල් සඳහා විශේෂ ගාස්තු ප්‍රමාණයන් අයකරනු ලබයි.
04) ප්‍රවාහන ගාස්තු ගණනය කිරීමේදී සැතපුමක කොටසක් ගණනය කරනු ලබන්නේ සම්පූර්ණ සැතපුමක් ලෙසටය.

05) මෙම නියෝග මාලාවේ ප්‍රවාහන ගාස්තු අය කිරීම සම්බන්ධ වෙනත් ආකාරයකට සඳහන් කර නොමැති විට, සතයක කොටසක් ගණනය කරනු ලබන්නේ සතයක් වශයෙනි.

බඩු ප්‍රවාහනය
01)ටොන් එකක් සඳහා සෑම සැතපුමකටම සත 80 නොඉක්මවූ ගාස්තු ප්‍රමාණයක්

02) සතුන්, මළ මිනී, ජීවීන්, කතුරු, ගල්, වෙනත් තුනකට කටවඩා බර ඇති ද්‍රව්‍ය හෝ කියුබික් අඩි 200 කට වැඩි වූ හෝ අඩි 14 කට වඩා දිග් වූ ද්‍රව්‍ය, සුළු හා ලිහිල් ද්‍රව්‍ය ප්‍රවාහන ගාස්තුවක් අයකිරීමට තරම් කුඩාකුඩා සැහැල්ලු සහ වියළුණු ද්‍රව්‍ය, විශේෂ ඇසුරුම් ප්‍රමාණයක් අවශ්‍ය වන බඩු වර්ග වෙඩි බෙහෙත්, භූමි තෙල් හා වෙනත් ඇවිළෙන සුළු තෙල් වර්ග. ගිනි විකුර, ගිනි පෙට්ටි හා අනතුරුදායී වෙනත් ද්‍රව්‍යයන් ප්‍රවාහනය සඳහා විශේෂ ගාස්තු ප්‍රමාණයක් අයකළ හැක.

03) බඩු ප්‍රවාහනයේදී අදාළ වන ප්‍රමාද ගාස්තු, රක්ෂණ ගාස්තු, ගබඩා ගාස්තු, පැටවුම් ගාස්තු වැනි අනෙකුත් ගාස්තු ඉහත සඳහන් ගාස්තු ප්‍රමාණයන්ට අමතර වන්නේය.





04) සැතපුමක කොටසක්, ප්‍රවාහන ගාස්තු ගණනය කිරීමේදී සම්පූර්ණ සැතපුමක් වශයෙන් ගණන් ගත යුත්තේය.

05) යම් කිසි බඩු ප්‍රවාහනයකට අදාළ අවම දුර ප්‍රමාණය හා අවම ගාස්තු ප්‍රමාණය නියෝග මගින් දක්වනු ලබන්නේය.

06) සෑම හොන්ඩරයකට කොටසක් සඳහා වූ ප්‍රවාහන ගාස්තුව නියෝග මගින් දක්වා ඇති පරිදි අය කළ යුතුවේ.

07) මෙම නියෝග මාලාවේ ප්‍රවාහන ගාස්තු අය කිරීම වෙනත් ආකාරයකට සඳහන් කර නොමැති විටක. සතයක කොටසක් ගණනය කරනු ලබන්නේ සම්පූර්ණ සතයක් වශයෙනි.

"පශු සම්පත්" — යන්නෙන්, යවන්නා හෝ ඔහුගේ නියෝජිතයා විසින් එකඟවී ඉදිරිපත් කරන ලද ප්‍රේෂණ පත්‍රයේ අඩංගු කොන්ත්‍රාත්තුවේ කොන්දේසි හා නියමයන් යටතේ ගව හෝ බඩු කරත්ත මඟින් ප්‍රවාහනය කරන සියළුම අශ්වයින්, පෝනියන්, බූරුවන්, සුනඛයින්, මීහරක්, ගොනුන්, එළදෙනුන්, වසුපැටවුන්, බැටළුවන්, එළුවන් , ඌරන් හෝ වන සතුන් අදහස් වේ.

"පාර්සල්" — යන්නෙන් මගී දුම්රිය මඟින් පාර්සල් ගාස්තු හා ඒ සඳහා නියම කරන ලද කොන්දේසිවලට යටත්ව ප්‍රවාහනය කරන සියළුම පාර්සල් ඇසුරුම්, බයිසිකල්, මාළු, පළතුරු, කුකුළු ආදී සතුන් සහ වෙනත් සියළුම ද්‍රව්‍ය හා දේවල් අදහස් වේ.

"මගියා" — යන්නෙන් සපයා ඇති කොන්දේසිවලට අනුකූලව විධිමත් පරිදි නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍රයක් හිමිව දුම්රිය ඇතුළත හෝ සිටින සිටින ඕනෑම පුද්ගලයෙකු අදහස් වේ.

"මගීන්ගේ ගමන් බඩු" — යන්නෙන් , මගී දුම්රිය, ගමන් බඩු, වෑන් මඟින් නොමිළයේ ගෙන යනු ලබන පෞද්ගලික බඩු බාහිරාදිය සහ වැඩිපුර ගමන් බඩු වෙනුවෙන් මුදල් ගෙවා ඇති වෙනත් ඕනෑම පෞද්ගලික අමතර බඩු බාහිරාදියක් අදහස් වේ.

"නියමිත" — යන්නෙන්, 3 වන වගන්තිය යටතේ, රීතිය මඟින් නියම කරන ලද බව අදහස් වේ.

"දුම්රිය" — යන්නෙන්, ලංකාණ්ඩුව විසින් හෝ දැනටමත් තනන ලද හෝ තනමින් පවතින හෝ ඉදිරියේදී තනනු ලබන සියළු දුම්රියන් අදහස් වේ.

"දුම්රිය නිලධාරියා" — යන්නෙන්, 2(1) වගන්තිය යටතේ පත් කරන ලද නිලධාරියෙකු හෝ ලිපිකරුවෙකු සහ දුම්රිය සේවය වෙනුවෙන් කිසියම් කාර්යයක් ඉටු කිරීම පිණිස කලින් කලට බඳවා ගනු ලබන කිසියම් තැනැත්තෙකු අයත් වීම අදහස් වේ.

"අශ්ව, රිය හා බඩු — යන්නෙන්, සැකසුම් ප්‍රමාණයන් අනුව අයකර අශ්ව ප්‍රවාහනය" පෙට්ටි , රිය පෙට්ටි හෝ නියාමක මැදිරි තුළින් මගී දුම්රිය මඟින් ප්‍රවාහනය කරන සියළුම අශ්වයින්, මැදිරි, සුනඛයින්, හරකුන්, එළදෙනුන්, ගවයින්, ඌරන්, වසු පැටවුන්, බැටළුවන්,එළුවන් සහ වෙනත් ඕනෑම සතෙකු හෝ කුමන හෝ වර්ගයක වාහන අදහස් වේ.



## 1983 අංක 49 දරණ දුම්රිය (සංශෝධන) පනත

(සහතික සටහන් කළේ 1983 දෙසැම්බර් මස 13 වන දින)

එල්.ඩී. ඕ. -9/82

දුම්රිය ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ.:
මේ පනත 1983 අංක 49 දරණ දුම්රිය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි ලැබේ.

2අ.අළුත් වගන්තිය 200 වන අධිකාරයෙහි ඇතුළත් කිරීම

(මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) දුම්රිය ආඥාපනතේ 2 වන වගන්තියට ඉක්බිතිවම මතු දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 2 අ වගන්තිය ලෙස බලාත්මක විය යුතුය.

මේ ආඥාපනතෙහි හෝ යම් ලිඛිත නීති යනාදියෙහි ලංකාණ්ඩුවේ දුම්රිය සේවය ලං.දු.සේ සහ ලංකා දුම්රිය සේවය, යන යෙදුම්, ශ්‍රී ලංකා දුම්රිය සේවය,ශ්‍රී.ලං.දු.සේ, ශ්‍රී ලංකා දුම්රිය සේවය යනුවෙන් වෙනස් කිරීම

2 අ මේ වගන්තිය ක්‍රියාත්මක වන දිනයෙහි සහ

(1) මේ ආඥාපනතෙහි හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ වෙනත් යම් ලිඛිත නීතියක් මඟින් හෝ යටතේ නිකුත් කරන ලද, නියම කරන ලද හැකනොත් අවසර දෙන ලද දැන්වීමක, පණිවිඩයක, ආඥාපත්‍රයක හෝ වෙනත් ලේඛනයක, "ලංකාණ්ඩුවේ දුම්රිය සේවය" යෙදුම හෝ "ලං.දු.සේ" යන එහි සංක්ෂිප්ත ස්වරූපය හෝ "ලංකා දුම්රිය සේවය" යන යෙදුම හෝ යෙදී ඇති සෑම අවස්ථාවකම ඒ වෙනුවට අවස්ථාවෝචිත පරිදි "ශ්‍රී ලංකා දුම්රිය සේවය" යන යෙදුම හෝ "ශ්‍රී.ලං.දු.සේ" යන එහි සංක්ෂිප්ත ස්වරූපය හෝ "ශ්‍රී ලංකා දුම්රිය සේවය" යන යෙදුම හෝ ආදේශ විය යුතුය.

(2) ( මෙහි මින්මතු "නිල ලාංඡනය" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී.ලං.දු.සේ" යන අකුරු ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් හෝ එය ඉංග්‍රීසි භාෂාවෙන් සහ එහි සමානාර්ථය සිංහල සහ දෙමළ භාෂා වලින් පමණක් හෝ දැක්වෙන්නා වූ යම් භාණ්ඩයක් ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපළක් ලෙස පූර්ණ නිගමනය කරනු ලැබිය යුතුය,. තවද

(3) 1983 දෙසැම්බර් මස 13 ට පෙර නිල හැඳින්වීම වූ සී.ජී.ආර් නමින් සඳහන් ඕනෑම දෙපලක් හෝ ලියවිල්ලක් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් විනවා ඇත.

**ප්‍රධාන පනතේ 7 වන වගන්තියේ සංශෝධනය**

3 ප්‍රධාන පනතේ 7 වන වගන්තිය සංශෝධනය කරමින් ඒ අනුව කටයුතු කරන අතර එහි සඳහන් වන පරිදි, යම් චෝදනාවකට වරදකරු වන අතර ඒ සඳහා දඩුවම් විඳීමට පවා සිදු වනු ඇතැයි යන්න ඒ වෙනුවට එවැනි වරදකදී වරදකරු වන්නාට රුපියල් තුන්සියයට (300/-) නොවැඩි දඩයකට යටත් වීමට හෝ එක් මසකට නොවැඩි වන කාලයකට සිරදඬුවම් හෝ එම දඩුවම් දෙකටම යටත් වන්නේ.

**31 වන වගන්තියට අළුතින් වගන්ති ඇතුලත් කිරීම**

4.31 වන වගන්තියට වහාම බල පවත්වන පරිදි පහත සඳහන් කොටස එකතු කරන අතර එය ප්‍රධාන පනතේ 31 අ,31ආ,31ඇ, සහ 31 ඈ යනුවෙන් ක්‍රියාත්මක වනු ඇත.

**ශ්‍රී.ලං.දු.දේ අයත් යම්කිසි දේපලවලට හානි සිදු කරනු ලැබුවහොත් ලැබෙන දඬුවම**

31 අ ශ්‍රී.ලං.දු.දේ.අයත් දේපල වලට හානි සිදු කරනු ලැබුවහොත් ලැබෙන දඬුවම - නීතියානුකූලව ලබාගත් අවසරයකින් තොරව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් දේපලක් හෝ ලියවිල්ලක් වෙනස් කරනු ලබන්නෙකුට මහෙස්ත්‍රාත් වරයෙකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකදී අපරාධ නඩු විධාන සංග්‍රහයට අනුව රුපියල් දෙදහසකට (2000/-) හෝ ඊට නොවැඩි දඩයකට යටත් වීමට හෝ එක් වසරකට වැඩි නොවන සිරදඬුවමක් පැනවීමට හෝ එම දඬුවම් දෙකටම හෝ යටත් වීමටසිදුවනු ඇත.

**ශ්‍රී.ලං.දු.දේ අයත් යම්කිසි දේපලකට හෝ ලියවිල්ලකට හෝ වෙනයම් දෙයක් වෙනස් කිරීම, විකෘති කිරීම සිදු කරනු ලැබුවහොත් ලැබෙන දඬුවම**

31 ආ. ශ්‍රී.ලං.දු.දේ අයත් දේපළකට හෝ ලියවිල්ලකට හෝ වෙනයම් දෙයක් වෙනස් කිරීම, විකෘති කිරීම සිදු කරනු ලැබුවහොත් ලැබෙන දඬුවම - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් දේපලක්, ලියවිල්ලක් හෝ වෙනත් භාණ්ඩයක් විකෘති කරනු ලැබුව හොත් හෝ මකා දැමුවහොත් හෝ වෙනයම් ක්‍රමයකින් නිල ලියවිල්ලක් ඒ අනුව විකෘති කරනු ලැබුව හොත් අපරාධ නඩු විධාන සංග්‍රහයට අනුව මහෙස්ත්‍රාත් ඉදිරියේ පැවැත්වෙන නඩුවකදී රුපියල් දෙදහසකට (2000/-) නොවැඩි දඩයකට හෝ එක් අවුරුද්දකට නොවැඩි සිර දඬුවමකට හෝ එම දඬුවම් දෙකම යටත් වීමට සිදුවනු ඇත.

**නිල ලාංඡනය දරණ යම් භාණ්ඩයක් නීත්‍යානුකූල හේතුවක් නොමැතිව ලබා ගැනීම,**

31 ඇ. නිල ලාංඡනය දරණ යම් භාණ්ඩයක් නීත්‍යානුකූල හේතුවක් නොමැතිව ලබා ගන්නා වූ ද සන්තක දරන්නාවූ ද සන්තකකරය දරන්නාවූ හෝ භාර දෙන්නාවූද යම් තැනැත්තෙක් වරදකට වරද කරු වන අතර මහේස්ත්‍රාත් වරයෙකු





**සන්තකයෙහි දැරීම, නැතහොත් තබා ගැනීම, විකිණීම හෝ බාර දීම සම්බන්ධයෙන්**

ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට 1979 අංක 05 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ විධිවිධාන වල කුමක් සඳහන්ව ඇතද රුපියල් දෙදහස(2000/-) නොඉක්මවන්නාවූ දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන්නාවූ කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගර ගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතුය.

යම් තැනැත්තෙක් භාණ්ඩයක් තම ප්‍රයෝජනය නැතහොත් ප්‍රතිලාභ පිණිස හෝ වෙනත් තැනැත්තෙකුගේ ප්‍රයෝජනය නැතහොත් ප්‍රතිලාභය පිණිස, වෙනත් යම් තැනැත්තෙකුගේ නියත සන්තකයේ නැතහොත් භාරයෙහි හෝ තමා පදිංචිව සිටිනා හෝ නොසිටින යම් ගෙඩනැගිල්ලක හෝ ස්ථානයක හෝ දැනුවත්ව තබා තිබේ නම් මේ වගන්තියේ කාර්යය සඳහා ඒ භාණ්ඩය ඒ තැනැත්තාගේ සන්තකයේ නැතහොත් භාරයෙහි ඇති ලෙස සලකනු ලැබිය යුතුය.

**දුම්රිය සාමාන්‍යාධිකාරී වරයාගේ හෝ බලය ලත් නිලධාරියෙකුගේ සහතිකය දේපලෙහි අයිතිය පිළිබඳ සාක්ෂිය විය යුතු බවය.**

31 ඈ. නිල ලාංඡනය දරණ දේපළක් ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දේපළක්ද නැද්ද යන්න ප්‍රශ්නය බවට පත්ව ඇති යම් නඩු පැවරීමක් සාමාන්‍යාධිකාරී වරයාගේ හෝ, ඔහු විසින් ඒ සඳහා ලියවිල්ලකින් විශේෂයෙන් බලය පවරන ලද වෙනත් නිලධාරියෙකුගේ අත්සන යටතේ වූ සහතිකයක් ඒ දේපළ ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දේපළක් බවට මුල් බැල්මට පෙනෙන සාක්ෂිය විය යුතුය

(200 වන අධිකාරිය) දුම්රිය සේවය

## දුම්රිය (සංශෝධන)

## එල්.ඩී.ඔ 12/98

### දුම්රිය ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 1998 අංක දරණ දුම්රිය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

2. දුම්රිය ආඥාපනත 38 වන වගන්තියේ (2) වන උප වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. 200 වන අධිකාරියේ 38 වන වගන්තිය සංශෝධන කිරීම

(2) 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ පටහැනිව කුමක් සඳහන්ව ඇතද දුම්රිය ස්ථානයක් භාර නිලධරයෙකුගේ නිළයට අඩු නොවන නිලයක් දරණ දුම්රිය නිලධරයෙකු විසින් හෝ ප්‍රධාන නියාමක වරයෙකු විසින් හෝ දුම්රිය ආරක්ෂක බලකායේ සාමාජිකයෙකු විසින් හෝ

ඒ දුම්රිය නිලධරයා විසින් [illegible] සඳහා කැඳවනු ලැබිය හැකි වෙනත් යම් කැනැත්තෙකු විසින් මේ ආඥාපනත යටතේ හැර වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ -

(අ) දුම්රියක හෝ සාමාන්‍යාධිකාරීවරයාගේ පාලනය යටතේ වූ ස්ථානයක හෝ වරදක් කරන යම් කැනැත්තෙකු හෝ

(ආ) දුම්රිය හෝ සාමාන්‍යාධිකාරීවරයාගේ පාලනය යටතේ වූ ස්ථානයක හෝ වරදක් සිදුකළේ ඇති බවට සිදු කළ බව දුටහ බවට, වරදක් සිදු කිරීමෙහිලා සම්බන්ධ බවට විරුද්ධව පැමිණිල්ලක් කර ඇත්තාවූ හෝ විශ්වාසවන්ත ලෙස තොරතුරු ලැබී ඇත්තාවූ හෝ සාධාරණ සැක කිරීම සඳහා කාරණා හේතු ඇත්තාවූ යම් කැනැත්තෙකු වරෙන්තුවක් නොමැතිව අල්ලීම, පෞද්ගලික සහ දේපළ [illegible] ගැනීම, කරනු ලැබිය හැකිය. තවද එවැනි යම් නිලධරයෙකු විසින් එවැනි යම් කැනැත්තෙකු අල්ලාගෙන රඳවා තබා ගනු ලැබූ අවස්ථාවක, ඒ නිලධාරියා විසින් ඒ කැනැත්තා, නීතියට අනුව ක්‍රියා කිරීම පිණිස පොලිස් නිලධරයෙකු වෙත භාර දෙනු ලැබිය යුතුය.

දුම්රිය (සංශෝධන)

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය. අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව

ඩබ්ලිව්.කේ.බී.වෙරගම
දුම්රියසාමාන්‍යාධිකාරී

1999 අප්‍රේල් 22 වැනි දින
දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය,
කොළඹ.



## 2005 අංක 12 දරණ දඩ මුදල් වැඩි කිරීමේ පනත

### II වන තීරය

| I වන තීරය<br>පනතෙහි නාමය | |
| --- | --- |
| 200 වන අධිකාරය වූ දුම්රිය ආඥාපනත | 1. 7 වන වගන්තියේ "රුපියල් තුන්සියක් නොඉක්මවන දඩයකට" යන වචන වෙනුවට "රුපියල් දහසකට නොඅඩු සහ රුපියල් එක්දහස් පන්සියය නොඉක්මවන දඩයකට" යන වචන ආදේශ කිරීමෙන් |
| | 1.12 වන වගන්තියේ "රුපියල් පනහක් නොඉක්මවන දඩයකට" යන වචන වෙනුවට "රුපියල් එක් දහසකට නොඅඩු සහ රු.දෙදහසක් නොඉක්මවූ දඩයකට යන වචන ආදේශ කිරීමෙන් |
| | 3. 18 වන වගන්තියේ ඒ එක් එක් වරද සම්බන්ධයෙන්" රු.දෙසියක් නොඉක්ම වූ "දඩයකට යන වචන වෙනුවට "ඒ ඒ එක් එක් වරද සම්බන්ධයෙන් රු.එක්දහසකට නොඅඩු සහ රු.පන්දහසක් නොඉක්මවන දඩයකට " යන වචන ආදේශ කිරීමෙන් |
| | 4. 20 වන වගන්තියේ "සෑම බඩු ටොන් එකක් සඳහා රු.පනහක් නොඉක්මවූ දඩයකට සහ ටොන් එකකට අඩු යම් බඩු ප්‍රමාණයක් සඳහා රු.විස්සක් නොඉක්මවූ දඩයකට" යන වචන වෙනුවට "සෑම බඩු ටොන් එකක් සඳහා රු.දෙදහසකට නොඅඩු සහ රු.පන්දහසක් නොඉක්මවන දඩයකට සහ ටොන් එකකට අඩු යම් බඩු ප්‍රමාණයක් සඳහා රු.එක්දහසකට නොඅඩු සහ රු.තුන් දහසක් නොඉක්මවන දඩයකට යන වචන ආදේශ කිරීමෙන් |
| | 5. 23 වන වගන්තියේ "රු.පනහක් නොඉක්මවන දඩයකට" යන වචන වෙනුවට රු.එක්දහසකට නොඅඩු සහ රු.දෙදහසක් නොඉක්මවන දඩයකට යන වචන ආදේශ කිරීමෙන්<br>6. 24 වන වගන්තියේ (1)වන උප වගන්තියේ "රු.එක්දහසක් නොඉක්මන දඩයකට" යන වචන වෙනුවට "රු.එක්දහසකට නොඅඩු සහ රු.තුන්දහසක් නොඉක්මන දඩයකට" යන වචන ආදේශ කිරීමෙන් |

7 24 වන වගන්තියේ (2) වන උප වගන්තියේ "රු.පනහකට නොඉක්මවන දඩයකට " යන වචන වෙනුවට "රු.එක්දහසකට නොඅඩු සහ රු.දෙදහසක් නොයික්මවූ දඩයකට" යන වචන ආදේශ කිරීම.

8 25 වන වගන්තියේ "රු.පනහක් නොඉක්මන දඩයකට" යන වචන වෙනුවට රු.එක්දහසකට නොඅඩු සහ "රු.දෙදහසක් නොඉක්මන දඩයකට" යන වචන ආදේශ කිරීමෙන්

9.26 වන වගන්තියේ "රු.එක්දහසක් නොඉක්මන දඩයකට හෝ යන වචන වෙනුවට "රු.එක්දහසකට නොඅඩු සහ රු.තුන්දහසක් නොඉක්මවන යන වචන ආදේශ කිරීමෙන්.

10 .27 වන වගන්තියේ "රු.දෙසීයක් නොඉක්මවන දඩයකට " හෝ යන වචන වෙනුවට රු.එක්දහසකට නොඅඩු සහ රු.තුන්දහසක් නොඉක්මවන දඩයකට හෝ යන වචන ආදේශ කිරීමෙන්

11 .28 වන වගන්තියේ "රු.එක් සියයක් නොඉක්මවන දඩයකට යන වචන වෙනුවට රු.එක්දහසකට නොඅඩු සහ රු.දෙදහසක් නොඉක්මවන දඩයකට " යන වචන ආදේශ කිරීමෙන්


12.31 (අ) වන වගන්තියේ රු.දෙදහසක් නොඉක්මවන්නාවූ දඩයකට යන වචන වෙනුවට රු.එක්දහසකට නොඅඩු සහ රු.තුන්දහසක් නොඉක්මවන දඩයකට" යන වචන ආදේශ කිරීම.

13.31(ආ) වන වගන්තියේ "රු.දෙදහසක් නොඉක්මවන්නාවූ දඩයකට" යන වචන වෙනුවට "රු.එක්දහසක් නොඅඩු සහ රු.තුන්දහසක් නොඉක්මවන දඩයකට" යන වචන ආදේශ කිරීමෙන්.

14.31(ඇ) වන වගන්තියේ රු.දෙදහසක් නොඉක්මවන්නා වූ දඩයකට යන වචන ආදේශ කිරීමෙන්.



## ORDER OF CODE TIMING




Outer circle indicates hourse from midnight (M) to 11.55 A.M. (LL), inner circle from 12 noon (MP) to 11.55 (LLP)

# ශ්‍රී ලංකා දුම්රිය සේවය

## දැක්ම

"ශ්‍රී ලංකා දුම්රිය සේවය හා සම්බන්ධ වන්නන්ට
අනභිභවනීය වටිනාකමක් ලබා දෙමින්
ශ්‍රී ලංකාවේ වැඩිම ඉල්ලුමක් ඇති
ගොඩබිම් ප්‍රවාහන පහසුකම් සපයන්නා වීම."

## මෙහෙවර ප්‍රකාශය

"මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා ආරක්ෂිත ,විශ්වාසදායී ,
නියමිත
වේලාවට ධාවනය වන,
සහසුරුවම් හා කාර්යක්‍ෂම
දුම්රිය ප්‍රවාහන සේවාවක් සපයමු.



# දුම්රිය ආරක්‍ෂක සේවය

## දැක්ම

දුම්රිය මගීන්ගේ,භාණ්ඩ වල ,
දුම්රිය කාර්ය මණ්ඩලයේ හා දේපළ වල
ආරක්‍ෂාව තහවුරු කිරීම

## මෙහෙවර ප්‍රකාශය

කාරයක්‍ෂම හා ක්‍රියාශීලී
සේවාවක් තුළින්
මගීන්,කාර්ය මණ්ඩලය ,
භාණ්ඩ හා දේපළ රකිමු.
නීතිය හා සාමය සුරකිමු